**හම්බන්තොට මහා නගර සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය**

-----------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 28 දින සභාවේ කොමසාරිස්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) රු. 1,380,280 ක් වූ වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණු අතර, තොරතුරු කළමනාකරණ පද්ධතිය සඳහා වූ ඌණ ප්‍රතිපාදනය රු. 144,250 ක් විය.

( ආ) සභාවේ කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 938,000ක මූල්‍ය ආධාර වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

( ඇ) රුහුණු ප්ලාසා ගොඩනැගිල්ලේ කුලී ආදායම සහ තානායම් කුලී රු. 322,000 ක් වැඩියෙන් ගිණුම්වල දැක්වුණි.

( ඈ) දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත දරා තිබුණු රු. 139,118 ක වියදම් අත්තිකාරම් ගිණුමට සටහන් කිරීම නිසා වර්ෂයේ වියදමින් සහ ණයගැති ශේෂයෙන් එම අගය අත්හැරී තිබුණි.

( ඉ) සමාලෝචිත වර්ෂයේ ටෙන්ඩර් කුලී, කඩකුලී, බිම්බදු සහ ආයෝජන ආදායම් පිළිවෙලින් රු. 42,903 ක් රු. 74,848 ක්, රු. 35,204 ක් හා රු. 26,543 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 05 ක ශේෂ සහ ඊට අදාළ පොත්පත් හා උප ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 9,501,045 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

------------------

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම් වල මුළු එකතුව රු. 7,981,184 ක් විය.

(ආ) ආසියානු සංවර්ධන බැංකු ණය මුදල් යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් සපයන ලද යන්ත්‍රසූත්‍ර වෙනුවෙන් සභාව විසින් ගෙවිය යුතු අර්ධ වාර්ෂික ණය වාරික 11 ක් හිඟ හිට තිබුණු අතර, රු. 425,190 ක් වූ ආරම්භක ණය ශේෂයෙන් කොටසක් හෝ ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

--------------------------------

එකතුව රු. 957,424 ක් වූ හිඟහිටි විදුලි ගාස්තු සම්බන්ධයෙන් උපලේඛනය සහ උපයෝගී ලේඛනද, එකතුව රු. 616,227 ක් වූ සේවක ණය සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද සේවක ණය ලේඛනය සහ උපලේඛනයද, රු. 425,190 ක් වූ ආසියානු සංවර්ධන බැංකු ණය සම්බන්ධයෙන් ශේෂ සනාථ, කාල විශ්ලේෂණය සහ උප ලේඛනද, රු. 101,660 ක් වූ ක්‍රීඩා උපකරණ සම්බන්ධයෙන් උපලේඛනද සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තාද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

--------------------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති¸රීති¸රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මහා නගර සභා ආඥා පනතේ 218 වගන්තිය | මහා නගර සභාව පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් මුදල් වර්ෂය අවසානය වූ පසු හැකිතාක් ඉක්මනින් පිළියෙල කර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

--------------------------

| | |
|---|---|
| i. මුදල් රෙගුලාසි 103 හා 104 | සභාව සතු බස් රථය හා බැකෝ යන්ත්‍රය අනතුරට පත්වී තිබුණු නමුත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 571 | එකතුව රු. 158,657 ක් වූ තැන්පත් ශේෂ 15 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**1.3.6 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

------------------------------------

(අ) මහා නගර සභා ආඥා පනතේ 216 වගන්තිය අනුව, ප්‍රතිපාදන මාරුකර ගැනීමෙන් තොරව ප්‍රතිපාදන ඉක්මවා රු. 11,865,262 ක වියදම් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු. 2,230,000 ක හිඟ තානායම් කුලී ලියාහැරීමට පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගෙන් ලැබුණු අනුමැතිය මත එම මුදල ඉක්මවා තවත් රු. 70,000 ක් වැඩියෙන් ලියා හැර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 5,253,528 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 5,118,444 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.135,084 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 95 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවතීමෙන් ආදායමට සාපේක්ෂව වියදම් ඉතා ඉහල අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) සෑම වර්ෂයකම ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා පුනරාවර්තන වියදම් දැරීම සැලකිය යුතු අගයන්ගෙන් අඛණ්ඩව වැඩි වී තිබීම මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව විගණනයේ අදහසයි.

**2.3 ආදායම් පරිපාලනය**

**----------------------**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කර තිබුණු රු. මිලියන 32 ක මුළු පුනරාවර්තන ආදායමින් රු. මිලියන 25.9 ක් රැස් කර තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 81 ක් පමණ විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම්වල එකතුව රු. මිලියන 10.16 ක් වූ අතර, එයින් රු. මිලියන 7.75 ක් අය කරගෙන තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 76 ක් විය.

**2.3.2 වරිපනම් බදු**

**--------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 2,317,739 ක් වූ අතර, දීර්ඝ කාලීනව වරිපනම් බදු නොගෙවන රු. 5,000 කට වැඩි හිඟ ශේෂයන් පවතින බදු ඒකක 54 ක් ඊට ඇතුළත් වී තිබුණි. මෙම හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥා පනතේ 252 වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) හම්බන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරන ලද කොහොලංකල, සිරිබෝපුර, කැලියපුර, සාමෝදාගම හා මිරිජ්ජවිල යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වල වරිපනම් බදු තක්සේරු කර අය කිරීමට මහා නගර සභා ආඥා පනතේ 230 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදු කුලී**

**--------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහ නගර සභා ආඥා පනතේ 253 (1) වගන්තිය ප්‍රකාරව හිඟ කඩකුලී හා ඉඩම් බදු අයකර නොගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු. 317,818 ක හිඟ ශේෂයක් විය.

(ආ) මහා නගර සභාවට අයත් රුහුණු ප්ලාසා ගොඩනැගිල්ලේ පළමු මහල 2010 ජූලි 05 වන දින සිට වසර 30 කට දීර්ඝකාලීනව බදු දී තිබූ අතර, 2015 අගෝස්තු 31 දින නව ගිවිසුමකට එළඹී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. ඉහත දේපලෙහි නවීකරණ හා සංවර්ධන කටයුතු සඳහා බදුකරු විසින් ඉදිරිපත් කර තිබූ රු. 11,660,000 ක ඇස්තමේන්තුව සහ ව්‍යාපෘති වාර්තාව, ශක්‍යතා අධ්‍යනයකින් තොරව රජයේ ඉංජිනේරුවරයකු හෝ තාක්ෂණික නිලධාරියෙකුගේ පරීක්ෂාවකට භාජනය නොකර සභාව විසින් අනුමත කර තිබුණි.

ii. බදු ගිවිසුමේ 02.01 ප්‍රකාරව ගිවිසුමට එළඹී 2010 ජූලි 5 දින සිට මාස 06 ක් ඇතුළත නිම කළයුතු නවීකරණ කටයුතු ගිවිසුම් කාලය අවසන් වී වර්ෂ 07 ක් ගත වී තිබුණු නමුත්, නිම කර නොතිබුණි.

iii. ගිවිසුමෙ 02.02 ඡේදය ප්‍රකාරව මාසික බදු මුදල් අය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,320,000 ක බදු මුදලක් සහා අරමුදලට අහිමිවී තිබුණි.

## 2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 94,831 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.2,636,900 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

## 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

(අ) හම්බන්තොට මාළු වෙළඳසැල බදුදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. හම්බන්තොට මාළු වෙළඳපොළ බදුකරු විසින් අඛණ්ඩව ජල බිල්පත් නොගෙවීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට හිඟය රු. 161,097 ක් වී තිබුණි.

ii. හිඟ ජල ගාස්තුවෙන් රු. 80,000 ක් හා රු.6,660 ක් වූ සැපයුම සන්ධි කිරීමේ ගාස්තුව සභාව විසින් 2016 ජනවාරි 22 වන දින ගෙවා තිබුණි.

iii. බදුකරු විසින් අඛණ්ඩව මාස 06 ක බදු මුදල් නොගෙවීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට වූ රු. 220,500 ක හිඟ බදු මුදල හා රු. 161,097 ක හිඟ ජල ගාස්තුව අයකර ගැනීමට නඩු පවරා තිබුණි.

iv. ජල සැපයුම නැවත සන්ධි කිරීමේ ගාස්තුව සහ දඩ මුදල නොසලකා නඩුව පවරා තිබීම නිසා ඒ වෙනුවෙන් දැරීමට සිදුවන මුදල සභාවට පාඩුවක්වී තිබුණි.

(ආ) ලේඛන යාවත්කාලීන නොකිරීම නිසා වර්ෂයකට පෙර මැතිවරණ කාර්යාලයෙන් ලැබී තිබුණු රු. 560,201 ක තැන්පත් මුදල් අදාළ පාර්ශවයන්ට ගෙවා නිරවුල් කිරීමට හෝ රාජ්‍ය ආදායමට ගැනීමට හෝ කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ තවදුරටත් රඳවාගෙන තිබුණි.

**3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් කසළ කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, සමස්ථ බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ රැස්කර බැහැර කිරීමේ සේවාව පවත්වා නොතිබුණි.

(ආ) 2008 ජනවාරි 25 දිනැති අංක 1553/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ "ආ"කාණ්ඩයට අයත් පරිසර බලපත්‍රය 2017 ජුනි 13 දින දක්වාම කසල බැහැර කරන භූමිය සඳහා ලබාගෙන නොතිබුණි.

**3.3 සේවක මණ්ඩල කළමනාකරණය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 4 ක හැට දෙදෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 17 ක තිස් අට දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත්කර ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

-----------------

වියදම් විෂයයන් 24 ක් සඳහා අයවැය ලේඛනය මගින් සලසා තිබූ එකතුව රු. 1,270,896 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදන මුදලද, වියදම් විෂයයන් 03 ක රු. 14,806,041 ක් වූ ඉතිරිවීම්ද වැය විෂයයන් 02ක රු. 1,646,944 ක සීමාව ඉක්මවා වියදම් දැරීම්ද ආදායම් විෂයයන් දෙකක ළඟා කර නොගත් රු. 259,179 ක ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා මහා නගර සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

----------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සඳහා සභාවේ නිලධාරීන් දෙදෙනෙකු යොදවා තිබුණද, ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 5 පද්ධති හා පාලන

------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) සේවකමණ්ඩල කළමනාකරණය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) අයවැය පාලනය